**සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදල - 2020**

----------------------------------------------- -----------

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

සත්වෝද්‍යාන සංවර්ධන හා සුභසාධන අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂය අවසන් වන විට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රු.14,928,060 ක් උපචිත වියදම් ලෙස හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඇති කර ගන්නා ලද බැඳීම් සියල්ල උපචිත වියදම් යටතේ සටහන් කිරීමට කටයුතු කරන බව දන්වමි. | උපචිත වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | 2016 වර්ෂයේදී වැඩ නිමකර අවසන් වූ වාගොල්ල සත්වෝද්‍යානයේ කිඹුල් අරණ ඉදිකිරීම ප්‍රාග්ධනීත කර තිබියදී ඒ වෙනුවෙන් ගෙවන ලද රු.1,729,236 ක් වූ උපදේශන ගාස්තු වියදම කෙරීගෙන යන වැඩ ලෙස දක්වා තිබුණි. | 2021 වර්ෂයේ ගිණුම් පිළියෙල කිරීමේදී ප්‍රාග්ධනීත කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.722,650 ක් වටිනා පක්ෂීන් වැරදි තොග ඇගයීමේ පදනම භාවිතා කිරීම හේතුවෙන් රු.80,000 කට අගය කිරීම නිසා පක්ෂීන්ගේ අගය රු.642,650 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරිමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | පක්ෂීන් තොග ඇගයීම නිවැරදිව සිදුකළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශපත්‍ර ආදායම් ගිණුම්ගත කිරීමේදී එකතු කළ අගය මත බදු වටිනාකම රු.1,004,258 ක් වැඩියෙන් ගණනය කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රවේශපත්‍ර ආදායම සහ එකතු කළ අගය මත බදු ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ආපනශාලා කුලී ආදායම සහ ජීප් රථ කුලී ආදායම පිළිවෙලින් රු.15,694,738 ක් හා රු.426,250 ක් වුවද ගිණුම්වල රු.16,780,923 ක් හා රු.544,050 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් පිළිවෙලින් ආපනශාලා කුලී ආදායම සහ ජීප් රථ කුලී ආදායම රු.1,086,185 කින් හා රු.117,800 කින් වැඩියෙන් හා ලැබිය යුතු අදායම රු.1,203,985 කින් වැඩියෙන් දක්වා තිබුණි. | 2021 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේදී කපා හැරීමටත් මෙමගින් ලාභයට සිදුවූ බලපෑම ගැලපීමටත් කටයුතු කරන බව දන්වමි. | ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ඉකුත් වර්ෂයේදී ප්‍රාග්ධනිත කර තිබූ නමුත් ක්ෂය ගැලපීම නොකරන ලද රු.650,874,579 ක වත්කම් සඳහා සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂයන් සඳහා කරන ලද ක්ෂය වෙන්කිරීම මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමේදී රු.16,522,372 ක් වැඩියෙන් දක්වා තිබුණි. තවද සමාලෝචිත වර්ෂයේදී ප්‍රාග්ධනිත කරන ලද රු.65,129,095 ක් වූ වත්කම් සඳහා ක්ෂය වෙන්කිරීම රු.1,479,456 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරි වර්ෂයේ ගිණුම පිළියෙල කිරීමේදී ගැළපීමට කටයුතු කරන බව. | ක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතුය. |

### 1.5.3 නොසැසඳුණු ශේෂ

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම | අනුරූපී වාර්තා අනුව වටිනාකම | වෙනස | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| අරමුදලේ මූල්‍ය ප්‍රකාශන අනුව භාණ්ඩාගාර තැන්පතු ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර සටහන්හි දක්වා ඇති ආරම්භක හා අවසාන ශේෂ සැසඳීමේදී පිළිවෙලින් රු.33,801,932 ක හා රු.33,230,026 ක වෙනසක් නිරීක්ෂණය විය. | රු.<br>2,957,096,088<br><br>2,594,576,144 | රු.<br>2,923,294,156<br><br>2,561,346,118 | රු.<br>33,801,932<br><br>33,230,026 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශන මඟින් එම එක් එක් වර්ෂයේ සිදුව ඇති වෙනස සඳහා සැසඳීම් ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීම සිදුකරනු ලබන බව දන්වමි. | වෙනසට හේතු සොයා නිවැරදි කළ යුතුය. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2019 සැප්තැම්බර් 09 දිනැති ලිපියේ පාස්කු ප්‍රහාරය හේතුවෙන් සත්වෝද්‍යානවල පවත්වාගෙන යනු ලබන වෙළඳසැල් 2019 අප්‍රේල් සිට ජූනි දක්වා වසා තබන ලද කාල සීමාවට අදාළව ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් තීරණයක් ගන්නා බව දන්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එලෙස තීරණයක් ගෙන නොතිබුණි. මේ හේතුවෙන් රු.4,782,701 ක් වූ හිඟ බදු කුලිය සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අයකරගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් අමාත්‍යාංශ ලේකම්තුමාට තීරණයක් ගන්නා මෙන් දන්වා ඇති බැවින් එම තීරණ දැනුම් දෙන ලෙස අවස්ථා ගණනාවකදීම අමාත්‍යාංශ ලේකම්තුමා දැනුවත් කිරීම සිදුකළද මේ වනතුරු ඒ තීරණය දැනුම් දී නොමැත. මේ සම්බන්ධයෙන් 3 වන සිහිකැඳවීම ද ඉදිරියේදී සිදුකිරීමට කටයුතු කරන බව දන්වමි. | කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1(අ)(ii) වගන්තිය | තරඟකාරී බව ප්‍රවර්ධනය කළ හැකි බවට සහතික වීම පිණිස පිරිවිතර සමාලෝචනය කිරීම තාක්ෂණික ඇගයීම් කමිටුවේ කාර්යභාරයක් වන නමුත් විදේශීය පක්ෂීන් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදනය සැලසුම් කිරීමේදී සියළු පක්ෂීන් විදේශීය පක්ෂීන් වීම, ශ්‍රී ලංකාව තුලදී අදාල සැපයුම සම්පූර්ණ කළ හැකි සැපයුම්කරුවන්ගේ සීමිත බව, වැනි කරුණු හේතුවෙන් දේශීය තරඟකාරිත්වය සීමාවීමේ හැකියාව පිළිබඳව තාක්ෂණික ඇගයීම් කමිටුව සලකා බලා නොතිබුණි. | ශ්‍රී ලංකාව තුළ ගෘහස්ථව සහ ප්‍රදර්ශනය පිණිස විදේශීය පක්ෂීන් ආනයනය සහ ඇතිකිරීම සිදුකරනු ලබන ව්‍යාපාරිකයින් සිටින බැවින් ලංසු කැඳවීම සඳහා ප්‍රමාණවත් තරම් සැපයුම්කරුවන් සිටින බව තාක්ෂණික ඇගයීම් කමිටුවට නිරීක්ෂණය වූ බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 409,287,647 පාඩුවක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ලාභය රු. 75,889,902 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 485,177,549 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට කොවිඩ් 19 වසංගතය නිසා සමාලෝචිත වර්ෂයේ මාස කිහිපයක් සියළු සත්වෝද්‍යාන වසා තැබීම හේතුවෙන් අදායම පෙර වර්ෂයට සාපේක්ෂව රු.557,932,879 කින් අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සත්ව අභිජනනය හා සංරක්ෂණය සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුවේ මූලික පරමාර්ථයක් වුවද 2011 වර්ෂයේ සිට පින්නවල අලි අනාථාගාරය තුල කිසිදු අලි පැටවකු උපත ලබා නොතිබුණි. | පිළිතුරු ලබා දී නොතිබුණි. | සත්ත්ව අභිජනනය සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) රිදියගම සෆාරි උද්‍යානයේ රු.මිලියන 7.2 ක වියදමින් ඉදිකර තිබූ ග්‍රාමීය විකුණුම් මධ්‍යස්ථාන 12 ක් 2018 මාර්තු 22 වන දින වැඩ අවසන් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් භාවිතයට ගැනීමකින් තොරව නිශ්කාර්යව තිබුණි. | ඉදිරියේදී මෙම ග්‍රාමිය අලෙවිසැල් ලංසුකරුවන් වෙත ප්‍රධාන කිරීමට කටයුතු කරන බව දන්වමි. | වත්කම් කාර්යක්ෂමව හා ඵලදායීව උපයෝජනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) 2019 ඔක්තෝම්බර් 08 දින ඉදිකිරීම් ආරම්භ කර තිබූ පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු ගිවිසුම ප්‍රකාරව 2020 මැයි 05 දින නිමකල යුතු වුවත් 2021 පෙබරවාරි 26 දින වන විටත් එහි වැඩ අවසන් වී නොතිබුණි. පක්ෂීන් ආනයනය කිරීමේ කටයුතු 2018 සිට 2020 දක්වා වසර 2 ½ ක පමණ කාලයක් තුල සිදුකර තිබුණද ප්‍රදර්ශනය කිරීමට ස්ථානයක් නොමැතිකම නිසා පක්ෂීන් 57 දෙනෙකු ප්‍රදර්ශනය කිරීමකින් තොරව සෆාරි උද්‍යානයේ වෙනත් කූඩුවල රඳවා තිබුණි. | කොරෝනා තත්වය හේතුවෙන් ආනයන ප්‍රමාද වීම නිසා පක්ෂි අරණෙහි ඉදිකිරීම් අවසන් කිරීමට නොහැකි වූ බවත් එම කටයුතු නිම කිරීමෙන් පසුව පක්ෂීන් ප්‍රදර්ශනය ආරම්භ කළ හැකි බව දන්වමි. | පක්ෂි අරණෙහි ඉදිකිරීම් කටයුතු අවසන් කර පක්ෂීන් ප්‍රදර්ශනය ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |

**3.2 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදේශීය පක්ෂීන් මිලදී ගැනීම් ප්‍රසම්පාදනයේදී ''එකම සැපයුම්කරුවකු විසින් පක්ෂීන් වර්ග 32 කම සැපයිය යුතුය'' යනුවෙන් කොන්දේසියක් පනවා පිරිවිතර පටු කිරීම හේතුවෙන් ලංසු ඉදිරිපත් කර තිබුණු සැපයුම්කරුවන් තිදෙනාගෙන් දෙදෙනෙකු පක්ෂීන් කිහිප දෙනෙකු සඳහා පමණක් ලංසු ඉදිරිපත් කර තිබුණු නිසා ප්‍රතික්ෂේප වී තිබුණි. එලෙස ප්‍රතික්ෂේප කරන ලද සැපයුම්කරුවන් ඉදිරිපත් කර තිබුණු මිලට වඩා වැඩි මිල ගණන්වලට තෝරා ගත් සැපයුම්කරුගෙන් පක්ෂීන් 53 දෙනෙකු මිලදී ගෙන තිබුණි.මේ හේතුවෙන් රජයට රු.17,860,085 ක පාඩුවක් සිදු වී තිබුණි. | මෙහිදී දී ඇති අයිතම සියල්ලම සඳහා මිල ඉදිරිපත් කළ යුතුය යන කොන්දේසිය මඟින්, ඉදිරිපත්ව තිබූ සැපයුම්කරුවන් තිදෙනෙකු අතරින් දෙදෙනෙකු ප්‍රතික්ෂේප වීම සිදු වී ඇති නමුත් ,එම සැපයුම්කරුවන් දෙදෙනා ප්‍රතික්ෂේප වනුයේ එම කොන්දේසිය නිසා ම පමණක් නොවන බව දන්වමි.. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |